SRI LANKA

# Stage - 03

## කළමනාකරණ ගිණුම්කරණය සහ මූල්‍ය
## Management Accounting and Finance

# T - 04

# කාරක ප්‍රාග්ධනය කළමනාකරණය

## කාරක ප්‍රාග්ධනය යනු ?

එදිනෙදා කටයුතු පවත්වාගෙන යාම සඳහා ආයතනයක් විසින් පවත්වාගෙන යනු ලබන ද්‍රවශීලී වත්කම් ප්‍රමාණය කාරක ප්‍රාග්ධනය යනුවෙන් හැඳින් වේ. කාරක ප්‍රාග්ධනය මගින් ව්‍යාපාරයක මෙහෙයුම් ද්‍රවශීලතාවය පිළිබිඹු කරයි.

ව්‍යාපාරයක කෙටිකලකින් මුදල් බවට පත්කරගත හැකි ජංගම වත්කම් මගින් එහි කෙටිකාලීන ගෙවිය යුතු දෑ ගෙවා දැමීමෙන් පසුව ද යම් මුදල් ප්‍රමාණයක් ඉතුරු වන්නේ ද, එම ප්‍රමාණය කෙටිකාලීන හදිසි අවශ්‍යතාවයන් සඳහා භාවිතා කළ හැකි වන්නේ ය. මෙය ව්‍යාපාරයේ කාරක ප්‍රාග්ධනය ලෙස සලකනු ලැබේ.

**කාරක ප්‍රාග්ධනය = ජංගම වත්කම් - ජංගම වගකීම්**

## කාරක ප්‍රාග්ධන කළමනාකරණය

කෙටිකාලීන මූල්‍යකරණය සහ කාරක ප්‍රාග්ධනයට අදාලව ගනු ලබන තීරණයන් කාරක ප්‍රාග්ධන කළමනාකරණය යනුවෙන් හැඳින්වේ. මෙමගින් ව්‍යාපාරයක කෙටිකාලීන වත්කම් සහ කෙටිකාලීන වගකීම් අතර සම්බන්ධීකරණය සිදුකරනු ලබයි.

ව්‍යාපාරයක මෙහෙයුම් කටයුතු නිසි ආකාරයකට පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් අරමුදල් ප්‍රමාණයක් පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වන අතර එමගින් කෙටිකාලීන ණය මුදල් පියවා ගැනීමටත් එදිනෙදා මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමටත් ව්‍යාපාරයට ඇති හැකියාව තහවුරු කළ යුතුය. එමෙන්ම අනවශ්‍ය අරමුදල් ප්‍රමාණයක් කෙටිකාලීන වත්කම් ලෙස ළඟ තබාගැනීමෙන් ව්‍යාපාරයට ලබාගත හැකි උපරිම ලාභය අහිමිවීම හෝ ඇතැම් විට පාඩු ලැබීමට ද මුහුණ පෑ හැක. මේ සඳහා කාරක ප්‍රාග්ධනය කළමනාකරණය මනාව සිදුකළ යුතුය.

කාරක ප්‍රාග්ධන කළමනාකරණයේ දී තොග, ලැබිය යුතු දෑ, ගෙවිය යුතු දෑ සහ මුදල් කළමනාකරණය පිළිබඳව අවධානය යොමු කෙරේ.

## කාරක ප්‍රාග්ධන කළමනාකරණයේ අරමqK

1. ආයතනයට එහි ක්‍රියාකාරීත්වය පවත්වාගෙන යාමට ඇති හැකියාව සහතික කිරීම.

2. කල්පිරෙන කෙටිකාලීන ණය පියවීමට සහ ඉදිරියට පවතින මෙහෙයුම් වියදම් සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රවාහයක් ඇති බවට සහිත කිරීම.

# කාරක ප්‍රාග්ධන අනුපාතhka

**1. ජංගම අනුපාතය**

කෙටිකාලීන ණය පියවීමේ හැකියාව තක්සේරු කිරීම සඳහා යොදාගැනෙන මෙම අනුපාතය මගින් ව්‍යාපාරයේ ජංගම වගකීම් රුපියලක් පියවීම සඳහා ව්‍යාපාරය සතුව ඇති ජංගම වත්කම් ප්‍රමාණය කොපමණක් ද යන්න නිරූපණය කරයි.

$$\text{ජංගම අනුපාතය} = \frac{\text{ජංගම වත්කම්}}{\text{ජංගම වගකීම්}}$$

**2. ක්ෂණික වත්කම් අනුපාතය**

ව්‍යාපාරයක ද්‍රවශීලතාවය මැනීම සඳහා භාවිතා කරන මෙම සූත්‍රය මගින් කෙටිකාලීන වගකීම් පියවීම සඳහා ඇති ඉතාමත් ඉක්මනින් මුදල් බවට පරිවර්තනය කළ හැකි වත්කම් (ක්ෂණික වත්කම්) ප්‍රමාණය පිළිබඳව අවධානය යොමු කෙරේ.

$$\text{ක්ෂණික අනුපාතය} = \frac{\text{ජංගම වත්කම් - තොගය}}{\text{ජංගම වගකීම්}}$$

**3. තොග රඳවා තබා ගැනීමේ කාලය**

අලෙවි වන දින දක්වා කොපමණ කාලයක් තොගය ව්‍යාපාරයක් තුල රඳවා තබා ගන්නේ ද යන්න මෙමගින් නිරූපණය වේ. අඩු කාලයකින් තොග විකුණුම් බවට පරිවර්තනය වන්නේ නම් ව්‍යාපාරයේ අලෙවි කටයුතු කාර්යක්ෂමව බව හඳුනාගත හැකිය.

තොග කාලය ගණනය සඳහා පහත සූත්‍ර දෙකම භාවිතා කළ හැකිය.

$$\text{තොග කාලය} = \frac{\text{සාමාන්‍ය තොගය}}{\text{විකුණුම් පිරිවැය}} \times 365$$

හෝ

$$\text{තොග කාලය} = \frac{365}{\text{තොග පිරිවැටුම් අනුපාතය}}$$

4. **තොග පිරිවැටුම් අනුපාතය**

කොපමණ සීඝ්‍රතාවයකින් තොග විකුණුම් බවට පත්වන්නේ ද, නැතහොත් සාමාන්‍ය තොගය විකුණුම් බවට පත්වන වාර සංඛ්‍යාව මෙමගින් ප්‍රකාශ කෙරේ.

$$\text{තොග පිරිවැටුම් අනුපාතය} = \frac{\text{විකුණුම් පිරිවැය}}{\text{සාමාන්‍ය තොගය}}$$

5. **ලැබිය යුතු දෑ කාල අනුපාතය / ණයගැති කාල අනුපාතය**

මුදල් ලැබෙන දින දක්වා කොපමණ කාලයක් ණයගැතියන් සිය ණය මුදල් නොගෙවා තබා ගන්නේ ද යන්න මෙමගින් නිරූපණය වේ. අඩු කාලයකින් ණයගැතියන් මුදල් බවට පරිවර්තනය වන්නේ නම් ව්‍යාපාරයේ ණය පාලනය කාර්යක්ෂමව බව හඳුනාගත හැකි අතර එසේ නොමැති නම් දිගු ණය කාලයන් තුලින් ව්‍යාපාරයට අනාගතයේ දී මුදල් ප්‍රවාහ ගැටළු වලට මුහුණ දීමට සිදුවිය හැකිය. ලැබිය යුතු කාලය ගණනය සඳහා පහත සූත්‍ර දෙකම භාවිතා කළ හැකිය.

$$\text{ණයගැති කාලය} = \frac{\text{සාමාන්‍ය ණයගැතියෝ}}{\text{ණයට විකුණුම්}} \times 365$$

හෝ

$$\text{ණයගැති කාලය} = \frac{365}{\text{ණයගැති පිරිවැටුම් අනුපාතය}}$$

6. **ලැබිය යුතු දෑ පිරිවැටුම් අනුපාතය / ණයගැති පිරිවැටුම් අනුපාතය**

කොපමණ සීඝ්‍රතාවයකින් ණයගැතියන්, මුදල් බවට පත්වන්නේ ද, නැතහොත් සාමාන්‍ය ණයගැතියෝ මුදල් බවට පත්වන වාර සංඛ්‍යාව මෙමගින් ප්‍රකාශ කෙරේ.

$$\text{තොග පිරිවැටුම් අනුපාතය} = \frac{\text{විකුණුම්}}{\text{සාමාන්‍ය ණයගැතියෝ}}$$

7. **ගෙවිය යුතු දෑ කාල අනුපාතය / ණයහිමි කාල අනුපාතය**

ව්‍යාපාරයේ ණය හිමියන්ට ගෙවීමට කොපමන කාලයක් ලබාගන්නේ ද යන්න මෙමගින් නිරූපණය වේ. වැඩි කාලයක් ණයහිමියන්ට මුදල් ගෙවීමට ලබාගන්නේ නම් ව්‍යාපාරයේ ණය පාලනය කාර්යක්ෂමව බව හඳුනාගත හැකිය.

ගෙවිය යුතු කාලය ගණනය සඳහා පහත සූත්‍ර දෙක ම භාවිතා කළ හැකිය.

$$\text{ණයහිමි කාලය} = \frac{\text{සාමාන්‍ය ණයගැතියෝ}}{\text{ණයට විකුණුම්}} \times 365$$

හෝ

$$\text{ණයහිමි කාලය} = \frac{365}{\text{ණයගැති පිරිවැටුම් අනුපාතය}}$$

8. **ගෙවිය යුතු දෑ පිරිවැටුම් අනුපාතය / ණයගැති පිරිවැටුම් අනුපාතය**

කොපමණ සීඝ්‍රතාවයකින් ණයහිමියනට, මුදල් ගෙවන්නේ ද, නැතහොත් ව්‍යාපාරයකට ණයහිමියන්ට ගෙවීමට ඇති හැකියාව මෙමගින් ප්‍රකාශ කෙරේ.

$$\text{ණයහිමි පිරිවැටුම් අනුපාතය} = \frac{\text{ගැණුම්}}{\text{සාමාන්‍ය ණයහිමියෝ}}$$

## කාරක ප්‍රාග්ධන චක්‍රය

මුදල් පරිවර්තනය චක්‍රය, ශුද්ධ මෙහෙයුම් චක්‍රය යන නම් වලින් ද හැඳින්වෙන මෙය මඟින් ජංගම වත්කම් සහ ජංගම වගකීම් මුදල් බවට පත්වීමට ගතවන කාලය නියෝජනය වේ. නැතහොත් කාරක ප්‍රාග්ධන චක්‍රය යනු ලබාගත් තොග සඳහා ගෙවීම් කළ දිනයත් එම තොගයන් අලෙවියෙන් පසු මුදල් ලැබීම සිදුවන දිනයත් අතර කාලය වේ. මෙම කාරක ප්‍රාග්ධන චක්‍රය අඩු කාලයක්ව පැවතීම ව්‍යාපාරයන්ට වඩාත් හිතකර වන අතර එසේ නොමැති වීමෙන් වැඩි මුදලක් කාරක ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කිරීමට සිදුවන අතර කාරක ප්‍රාග්ධන ගැටළුවලට ද මුහුණ දීමට සිදුවිය හැකිය.

## වෙළෙඳ ව්‍යාපාර ආයතනයක කාරක ප්‍රාග්ධන චක්‍රය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කාරක ප්‍රාග්ධන චක්‍රය | = | ණයගැති කාලය | + | තොග කාලය | - | ණයහිමි කාලය |

## නිෂ්පාදන ව්‍යාපාර ආයතනයක කාරක ප්‍රාග්ධන චක්‍රය

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| කාරක ප්‍රාග්ධන චක්‍රය | = | ණයගැති කාලය | + | අමුද්‍රව්‍ය තොග ලෙස පවතින සාමාන්‍ය කාලය | + | භාණ්ඩ නිෂ්පාදනයට ගතවන සාමාන්‍ය කාලය | - | ණයහිමි කාලය |

### අභ්‍යාස

01. නිම්සර සමාගමේ 2015 වසර සඳහා වූ තොරතුරු කිහිපයක් පහත දක් වේ.

| | | |
|---|---|---|
| තොග කාලය | - | දින 65 |
| ණයගැති කාලය | - | දින 55 |
| ණයහිමි කාලය | - | දින 40 |

කාරක ප්‍රාග්ධන චක්‍රය ගණනය කරන්න.

02. මල්ෂා සමූහයේ පසුගිය වසර 2 ක ගිණුම් කට්ටලයන්ගෙන් ලබාගත් තොරතුරු කිහිපයක් පහත පරිදි වේ.

රු. මිලියන

| | 2019 | 2020 |
|---|---|---|
| මුදල් | 200 | 110 |
| තොගය | 500 | 450 |
| ණයගැතියෝ | 600 | 625 |
| ණයහිමියෝ | 400 | 350 |
| ආදායම | 3,000 | 2,950 |
| විකුණුම් පිරිවැය | 2,500 | 2,750 |

කාරක ප්‍රාග්ධන චක්‍රය ගණනය කරන්න.

03. මනුජ සමාගමේ 20XX වසර සඳහා තොරතුරු කිහිපයක් පහත දැක් වේ.

| | | |
|---|---|---|
| ණයගැති පිරිවැටුම් අනුපාතය | - | 11 |
| තොග පිරිවැටුම් අනුපාතය | - | 09 |
| ණයහිමි පිරිවැටුම් අනුපාතය | - | 08 |

කාරක ප්‍රාග්ධන චක්‍රය ගණනය කරන්න.

04. රවීශා ව්‍යාපාරයේ 20XX වසර සඳහා වූ තොරතුරු කිහිපයක් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍ය රඳවාගැනීමේ කාලය | - | දින 60 |
| නොනිමි වැඩ රඳවාගැනීමේ කාලය | - | දින 25 |
| නිමි තොග රඳවාගැනීමේ කාලය | - | දින 30 |
| ණයගැති රඳවාගැනීමේ කාලය | - | දින 65 |
| ණයහිමි රඳවාගැනීමේ කාලය | - | දින 55 |

කාරක ප්‍රාග්ධන චක්‍රය ගණනය කරන්න.

## කාරක ප්‍රාග්ධන කළමනාකරණය සඳහා වූ උපාය මාර්ග

## මුදල් කළමනාකරණය

මුදල් යනු කාරක ප්‍රාග්ධනයේ එක් ප්‍රධාන උපාංගයක් වන අතර එය කළමනාකරණය යනු එදිනෙදා සිදුවන කටයුතු සඳහා අවශ්‍ය මුදල් අවශ්‍යතාවය හඳුනාගැනීමත් සහ එහිදී දැරීමට සිදුවන මුදල් රඳවාගැනීමේ පිරිවැය අවම කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමත් ය.

මුදල් බවට පත්කළ හැකි කෙටිකාලීන වත්කම් ලෙස තබාගැනීමෙන් අවශ්‍ය ඕනෑම අවස්ථාවක කෙටිකාලීන වගකීම් ගෙවා දැමීම පහසු වන නමුත් එමගින් එම මුදල් ආයෝජනයෙන් උපයාගත හැකි ලාභය ලබාගැනීමට නොහැකි වේ. එබැවින් සෑම ව්‍යාපාර ආයතනයක්ම ද්‍රවශීලතාවය සහ ලාභදායකත්වය අතර මනා සමබරතාවයක් පවත්වාගත යුතු වේ.

## මුදල් ප්‍රවාහ ගැටළු ඇතිවිය හැකි ආකාර

- **දිගින් දිගට ම අලාභයක් ඇතිවීම.**

  නිතර අලාභයන්ට මුහුණ දීම හේතුවෙන් ව්‍යාපාර ආයතනයන්ට මුදල් ප්‍රවාහ ගැටළු වලට මුහුණ පෑමට සිදු වේ.

- **උද්ධමනය**

  උද්ධමනයකට මුහුණ දෙන විට පෙර දැරූ වියදමට වඩා වැඩි මුදල් ප්‍රවාහයක් එම කාර්යයන් ඉටු කරවා ගැනීම සඳහා ම නැවත දැරිය යුතු වේ.

- **සීඝ්‍ර වර්ධනය**

  වර්ධන කාලය තුල පෙර පැවති තත්වයන්ට වඩා මෙහෙයුම් පුළුල් වන බැවින් පෙරට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් අවශ්‍ය වේ.

- **කාලීන විකුණුම් රටාවන්**

  කාලීන විකුණුම් රටාවක් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයන් අදාල කාලය එනතෙක් නිෂ්පාදනය කටයුතු සිදුකිරීමට සඳහා මුදල් ප්‍රවාහ ගැටළු වලට මුහුණ දීමට සිදු වේ.

- **එක් වරක් පමණක් ඇතිවන වියදම්**

## මුදල් ඌණතාවය මගහරවාගැනීමට සිදුකළ හැකි ක්‍රියාමාර්ග

- ප්‍රාග්ධන වියදම් කල් දැමීම.
- ණයගැතියන්ගෙන් ලැබීමට ඇති දෑ ඉක්මනින් ලබාගැනීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙලයන් ඇති කිරීම.
- මුදල් හිඟය තීව්‍ර නම්, ආයතනය සතුව පවතින වැදගත්කමින් අත්‍යවශ්‍යම නොවන වත්කම් කිහිපයක් අලෙවි කිරීම.
- මුදල් ගෙවීම ප්‍රමාද කර ගෙවීම සඳහා එකඟතාවයන් ඇති කර ගැනීම.
- බැංකු අයිරාවක් අනුමත කරවා ගැනීම.
- කෙටිකාලීන බැංකු ණයක් ලබා ගැනීම.

## මුදල් අතිරික්තයන් ආයෝජනය සිදුකළ හැකි ක්‍රමයන්

- කෙටිකාලීන බැංකු තැන්පතු වල දැමීම.
- කෙටිකාලීන මූල්‍ය උපකරණයන්හි ආයෝජනය.
- ණයහිමියන්ට කලින් ගෙවීම් සිදුකිරීම තුලින් වට්ටම් ලබා ගැනීම.

## තොග කළමනාකරණය

මුදල් මෙන්ම තොගයද සෑම ව්‍යාපාර ආයතනයක්ම මනාව පාලනය කළ යුතු වන අතර අවශ්‍ය ප්‍රමාණයට තොග නොමැතිවීමෙන් ඇතිවිය හැකි තොග නොමැතිවීමේ පිරිවැයට අවම කිරීමට මෙන් ම අනවශ්‍ය ලෙස තොග තබාගැනීමෙන් දැරීමට සිදුවන තොග තබාගැනීමේ පිරිවැය ද අවම කිරීමට ද අවශ්‍ය තීරණ ගැනීම තොග කළමනාකරණයේ ප්‍රධාන අංගයකි.

## තොග කළමනාකරණයේ උපාය මාර්ගයන්

1) තොග ආකෘති (**EOQ/EBQ** වැනි දෑ)

මුළු තොග පිරිවැය අවම වන පරිදි මිලට ගත යුතු ඒකක ප්‍රමාණය ආර්ථික ඇණවුම් ප්‍රමාණය **(EOQ)** වන අතර නිෂ්පාදන පිරිවැය අවම වන පරිදි වරකට නිපදවිය යුතු ඒකක ප්‍රමාණය ආර්ථික කාණ්ඩ ප්‍රමාණය **(EBQ)** මගින් හදුනාගනු ලබයි.

2) අවශ්‍ය විට දී මිල දී ගැනීමේ ක්‍රමය (**JIT** ක්‍රමය)

**JIT** ක්‍රමය **JIT** නිෂ්පාදනය සහ **JIT** මිල දී ගැනීම ලෙස දෙආකාරයකින් ක්‍රියාත්මක වන මෙම ක්‍රමය මගින් නිෂ්පාදනයට හෝ අලෙවියට තොග අවශ්‍ය වන අවස්ථාවේ දී පමණක් මිල දී ගැනීම හෝ නිෂ්පාදනය කිරීම යන සංකල්පය මත මෙය පදනම් වේ. මෙමගින් තොග තබාගැනීමේ පිරිවැය මුළුමනින්ම වලක්වාගත හැකිවන අතර, ශ්‍රම ඵලදායීතාවය වර්ධනය කරගැනීමට, අපතය නාස්තිය අවම කරගැනීමට, කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය අවම කරගැනීමට මෙන් ම නිෂ්පාදන කාලය අවම කරගැනීමට ඉවහල් වේ.

3) **ABC** විශ්ලේෂණය

තොගය එහි වටිනාකම මත කාණ්ඩ තුනකට වර්ගීකරණය කරමින් ගබඩාකර තබාගත යුතු ආකාරය ප්‍රකාශ කෙරෙන තොග වර්ගීකරණ ශිල්පීය ක්‍රමයකි. මෙමගින් අවම හානියක් ඇතිවන පරිදි තොගය ගබඩාකර තබාගැනීම පිළිබඳව අවධානය යොමු කෙරේ.

## ලැබිය යුතු දෑ කළමණාකරණය

මුදල්, තොගය මෙන් ම ණයගැතියන් ද කාරක ප්‍රාග්ධන කළමනාකරණයේ ප්‍රධාන අංගයකි. ණයගැතියන්ගෙන් නිසි කලට මුදල් එකතු කරගැනීමත් නිවැරදි ප්‍රතිපත්තියක් මත ණය කළමනාකරණය කිරීමත් ව්‍යාපාරයක පැවැත්මට අත්‍යවශ්‍ය අංගයක් වේ.

## ණයගැතියන් කළමනාකරණයේ උපාය මාර්ග

- ණය කාලය දීර්ඝ කිරීම
- කලින් ණය පියවීමේ දී වට්ටම් ප්‍රදානය කිරීම.
- ණය සාධ්‍යකරණය (ණය ගැතියන් අලෙවි කිරීම)
- ඉන්වොයිසි වට්ටම් කිරීම
- ණයගැතියන් රක්ෂණය

## ගෙවිය යුතු දෑ කළමනාකරණය

කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය සඳහා සෘජුවම බලපෑමක් කරනු ලබන ගෙවිය යුතු දෑ කළමනාකරණය කිරීම වැදගත් වේ. මේ සඳහා පහත ක්‍රියාමාර්ගයන් පිළිබඳව උනන්දුවක් දක්වයි.

1. සැපයුම්කරුවන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ණය පදනම මත භාණ්ඩ ලබාගැනීමට උත්සාහ කිරීම.
2. මුදල් හිඟතාවන්හීදී ණයහිමියන් සමග සාකච්ඡා කර ණය කාලය දීර්ඝ කරගැනීමට උත්සාහ කිරීම.
3. ස්ථාවර සහ වැදගත් සැපයුම්කරුවන් සමග හොඳ සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම.

## පසුගිය විභාග ප්‍රශ්න

## 2019 ජූලි

03. **සීමාසහිත** RCV **සමාගමට** අදාල පහත සඳහන් තොරතුරු පසුගිය ගිණුම් වර්ෂ තුන සඳහා අදාල වේ.

| අයිතමය | 2016/17 | 2017/18 | 2018/19 |
|---|---|---|---|
| වෙළෙඳ ලැබිය යුතු මුදල් (රු.) | 1,459,000 | 1,897,500 | 2,453,600 |
| විකුණුම් පිරිවැය (රු.) | 9,600,000 | 10,800,000 | 11,500,000 |
| දළ ලාභ අනුපාතය | 6% | 10% | 8% |

වර්ෂයට දින 365 ක් බව ද, සියලුම විකුණුම් ණය පදනම මත සිදුකරන බව ද උපකල්පනය කරන්න.

**ඔබ විසින් කළ යුතු දෑ :**

a) 2017/18 සහ 2018/19 වර්ෂ සඳහා වෙළෙඳ ලැබිය යුතු මුදල් එකතු කර ගැනීමේ කාලය ගණනය කරන්න. (ලකුණු 03)

b) ලැබිය යුතු මුදල් එකතු කර ගැනීමේ කාලය වැඩිදියුණු කර ගැනීම සඳහා සීමාසහිත RCV සමාගමට භාවිත කළ හැකි උපාය මාර්ග දෙකක් (02) සඳහන් කරන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 2020 ජුලි

03. **සීමාසහිත ට්‍රේඩ් සමාගමේ** 2020 මාර්තු 31 සහ 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා / දිනට පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී.

(රු.)

| | 2019/20 | 2018/19 |
|---|---|---|
| විකුණුම් | 5,671,500 | 4,500,000 |
| විකුණුම් පිරිවැය | 5,000,000 | 4,150,000 |
| අවසාන තොගය | 1,120,000 | 880,000 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 455,500 | 321,500 |

2019/20 වර්ෂය සඳහා වෙළෙඳ ගෙවිය යුතු මුදල් පියවීමේ කාලය දින 35 කි.

සියලුම විකුණුම් ණය පදනම මත සිදුකරනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ :**

a) 2019/20 වර්ෂය සඳහා, සීමාසහිත ට්‍රේඩ් සමාගමේ කාරක ප්‍රාග්ධන චක්‍රයේ දිග ගණනය කරන්න. (ලකුණු 03)

b) සීමාසහිත ට්‍රේඩ් සමාගම විසින් එහි වෙළෙඳ ගෙවිය යුතු මුදල් හි පියවීමේ කාලය වැඩිදියුණු කරගැනීම (improve) සඳහා භාවිත කළ හැකි උපායමාර්ග දෙකක් (02) සඳහන් කරන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## නියාමන ප්‍රශ්න පත්‍රය - 2020

03. පහත සඳහන් තොරතුරු වෙළඳ සමාගමක් වන සීමාසහිත ඇලෝයි සමාගමේ 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාල වේ.

| | | |
|---|---|---|
| වාර්ෂික විකුණුම් වටිනාකම | - | රු. 8,000,000 |
| දළ ලාභය | - | විකුණුම් පිරිවැය මත 25% කි. |
| වර්ෂය සඳහා නිමි භාණ්ඩ තොගයේ සාමාන්‍යය | - | රු. 560,000 |
| ණයගැති පිරිවැටුම් අනුපාතය | - | වාර 7.5 කි. |
| වෙළඳ ගෙවිය යුතු මුදල් පියවීමේ කාලය | - | දින 40 |

ඔබ විසින් කළයුතු දෑ :

2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාරක ප්‍රාග්ධන චක්‍රයේ දිග ගණනය කරන්න. (ලකුණු 05)